# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1770/24 – 2012 අගෝස්තු 10 වැනි සිකුරාදා – 2012.08.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/19/2012.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20 හි පිහිටා ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අනෙක් පාර්ශවය වශයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය හි පිහිටා ඇති අන්තර් විශ්ව විද්‍යාලයීය වෘත්තීය සමිති මහ සම්මේලනය, 65/ඒ/2, 5 වන පටුමග, ජෝතිපාල මාවත, මාලඹේ හි පිහිටා ඇති ඉන්ටර් යුනිවර්සිටි ඇකඩමික් සපෝර්ට් ස්ටාෆ් ඇසෝසියේෂන්, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය හි පිහිටා ඇති ඉන්ටර් යුනිවර්සිටිස් ටෙක්නිකල් ඔෆිසර්ස් යුනියන්, 416, කෝට්ටේ පාර, පිටකෝට්ටෙහි පිහිටා ඇති ජාතික සේවක සංගමය, 12/2, සුභූති මාවත, බත්තරමුල්ල හි පිහිටා ඇති අන්තර් විශ්වවිද්‍යාලයීය සේවා වෘත්තීය සමිතිය, මාර්ස් ශාලාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය හි පිහිටා ඇති අන්තර් විශ්ව විද්‍යාලයීය උප ශාලාධිපතිවරුන්ගේ සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ හි පිහිටා ඇති ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය මාණ්ඩලික සහකාරවරුන්ගේ සංගමය අතර 2012 ජුනි 26 වැනි දින ඇතිකරගන්නා ලද (131 වැනි අධිකාරය වන 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 12 (1) වගන්තිය යටතේ ඇති කරගන්නා ලද) කාර්මික ආරාවුල් බේරුම් කිරීමේ කොන්දේසි පත්‍රය ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 12 (6) වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්,

2012 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

ගොනු අංකය: අයිආර්/21/19/2012.

**131 වැනි අධිකාරය වන 1950 අංක 43 දරන**
**කාර්මික ආරාවුල් පනතේ 12 (1) වගන්තිය**
**යටතේ කාර්මික ආරාවුල බේරුම් කිරීමේ කොන්දේසි පත්‍රය**

මෙහි මින් මතු සේවා යෝජකයා වශයෙන් හඳුන්වනු ලබන පළමු පාර්ශ්වය වූ
කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20 හි,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වෙනුවෙන් සහ දෙවන පාර්ශ්වය වූ මෙහි මින් මතු සේවකයින් වශයෙන් හඳුන්වනු ලබන සේවකයින් නියෝජනය කරන වෘත්තීය සමිති වූ

අන්තර් විශ්ව විද්‍යාලයීය වෘත්තීය සමිති මහා සම්මේලනය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

ඉන්ටර් යුනිවර්සිටි ඇකඩමික් සපෝර්ට් ස්ටාෆ් ඇසෝෂියේෂන්,
65/ඊ/2, 5 වන පටුමග, ජෝතිපාල මාවත, මාලඹේ.

ශ්‍රී ලංකා යුනිවර්සිටීස් ටෙක්නිකල් ඔෆිසර්ස් යුනියන්,
වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය.

ජාතික සේවක සංගමය,
416, කෝට්ටෙ පාර, පිටකෝට්ටේ.

අන්තර් විශ්ව විද්‍යාලයීය සේවා වෘත්තීය සමිතිය,
12/2, සුභූති මාවත, බත්තරමුල්ල.

අන්තර් විශ්ව විද්‍යාලයීය උප ශාලාධිපතිවරුන්ගේ සංගමය,
මාර්ස් ශාලාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල මාණ්ඩලික සහකාරවරුන්ගේ සංගමය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

අතර, 1950 අංක 43 දරන (පසුව සංශෝධිත) 131 වන අධිකාරය වූ කාර්මික ආරාවුල් පනතේ 48 වැනි වගන්තියෙන් අර්ථ විග්‍රහ කර ඇති ආකාරයට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කාර්මික ආරාවුලක් පවතින හෙයින්,

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද අංක 879 දරන චක්‍ර ලේඛයේ පහළම මූලික වැටුප හා ඉහළම මූලික වැටුප අතර, තබා ඇති වැටුප් අනුපාතය වන 1 : 3 : 59 ක් වන සේ ප්‍රායෝගිකව ගැලපෙන අයුරින් එම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද අංක 975 සහ 2012.01.13 දින චක්‍ර ලේඛය සහ අංක 985 සහ 2012.05.15 දින නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් සකස් නොකිරීම හේතුවෙන් විශ්ව විද්‍යාල අධ්‍යයන සහාය සහ අනධ්‍යන සේවකයින්ගේ වැටුප් විෂමතාවයක් ඇති බව සේවක පක්ෂය කියා සිටී.

2. විශ්ව විද්‍යාලවල අධ්‍යයන සහාය සහ අනධ්‍යයන සේවකයින් සමහර තනතුරු ශ්‍රේණිගත කිරීමේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද අංක 975, 2012.01.12 දින සහ 985, 2012.05.15 දින චක්‍ර ලේඛ මගින් විෂමතාවයන් ඇති වී ඇති බව සේවක පක්ෂය ප්‍රකාශ කරයි.

එකී කාර්මික ආරාවුල සමාදානයෙන් විසඳා ගැනීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට ඉහත පාර්ශ්වකරුවන් එකඟ වේ.

**බේරුම් කිරීමේ කොන්දේසි**

**සේව්‍ය පාර්ශ්වය**

1. සේව්‍ය පාර්ශ්වය නියෝජනය කරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මෙම ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමෙන් පසු එතැන් සිට සති දෙකක් ඇතුලත වෘත්තීය සමිති විසින් තවදුරටත් පවතින බවට ප්‍රකාශ කරන වැටුප් විෂමතා පිළිබඳව වෘත්තීය සමිති සමග සාකච්ඡා කර විසඳුමක් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යංශය හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග සාකච්ඡාවක් ලබා දීමට එකඟ වේ. එම සාකච්ඡාවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහභාගි වීමට එකඟ වේ.

2. එහිදී සේවක ඉල්ලීම් වලට හැකිතාක් ආසන්න විසඳුමක් දීමට ද එම විසඳුම වෘත්තීය සමිතිවල යෝජනා ලැබී දින 45 ක් තුල ලබා දීමටද සේව්‍ය පාර්ශ්වය එකඟ වේ.

3. ඉහත 1 යටතේ ඇති වන සාකච්ඡාවලින් අනතුරුව මුදල් අමාත්‍යංශය හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සේවා යෝජකයා වෙත ලබා දෙන නිර්දේශ මෙයට ඉහත දෙවන ඡේදය යටතේ සඳහන් කාල සීමාව තුළ ලැබී දින 07ක් ඇතුළත නව චක්‍ර ලේඛයක් නිකුත් කිරීමට සේවා යෝජකයා එකඟ වේ.

4. වැඩ වර්ජනය කිරීමේ හේතුව නිසා කිසිම සේවකයකුගෙන් මොනයම් ආකාරයක හෝ පලි ගැනීමක් හෝ දඬුවමක් නොකිරීමටත් සේවකයන්ගේ නීත්‍යානුකූල වරප්‍රසාද අහිමි නොකිරීමටත් සේව්‍ය පක්ෂය එකඟ වන අතර සේවා යෝජකයා හා සේවකයින් අතර සුහද සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරීමටත් එකඟ වේ.


**සේවක පාර්ශ්වය**

1. දැනට ක්‍රියාත්මක වන අඛණ්ඩ වැඩ වර්ජනය අවසන් කර සේවකයන් දැනුවත් කර පැය 24ක් ඇතුලත සේවයට වාර්තා කිරීමට වෘත්තීය සමිති එකග වේ.

2. මෙම ගිවිසුම අත්සන් කර දින 07ක් ඇතුළත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2012 .01.12 දින නිකුත් කළ අංක 975 දරන චක්‍රලේඛය සහ 2012.05.15 දින නිකුත් කළ අංක 985 දරන චක්‍රලේඛය හේතු කොටගෙන ඇති වී ඇතැයි කියන විෂමතා පිළිබඳ ලිඛිත විස්තරයක් වෘත්තීය සමිති විසින් සේවා යෝජකයාට දන්වා යැවීමට එකග වේ.

3. අනධ්‍යන සේවකයින් වැඩ වර්ජනය අවසන් කර සේවයට නැවත වාර්තා කිරීමෙන් අනතුරුව විශ්ව විද්‍යාල කළමනාකාරිත්වය සමග සුහද සේවක සේව්‍ය සම්බන්ධතාවයක් ඇති කර ගෙන සේවා කටයුතු කිරීමට වෘත්තිය සමිති එකගවේ.

කොළඹ 05, කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු කොමසාරිස් ජනරාල් වී. බී. පී. කේ. වීරසිංහ මහත්මිය ඉදිරියේ 2012 ජුනි මස 26 දින වූ මෙදින මෙහි සඳහන් සේවා යෝජක පාර්ශ්වය වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වෘත්තීය සමිති විසින් මෙම ගිවිසුමට අත්සන් කරන්නට යෙදුනි.



මගේ යොමු අංකය: IR/10/38/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

1. ආර්. එම්. ජී. රාමනායක මයා, F 22, ෆැලැන්කලන් වත්ත, බාඳුරාගොඩ පාර, වේයන්ගොඩ.
2. ආර්. එච්. හේමසිරි මයා, නො 53, ශ්‍රමදාන මාවත, සිංහාරමුල්ල, කැළණිය.
3. ඩබ්. එච්. සුසිල් ප්‍රේමරත්න මයා, නො. 121 D, බුළුගහගොඩ, ගනේමුල්ල.
4. එච්. එම්. ජේ. බණ්ඩාර මයා, නො. 426/19, රජවත්ත පාර, කපුගොල්ල, උඩුගම්පොල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128හි, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/38/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශවයක් වශයෙන්

1. ආර්. එම්. ජී. රාමනායක මයා, F 22, ෆැලැන්කලන් වත්ත, බාඳුරාගොඩ පාර, වේයන්ගොඩ.
2. ආර්. එච්. හේමසිරි මයා, නො 53, ශ්‍රමදාන මාවත, සිංහාරමුල්ල, කැළණිය.
3. ඩබ්. එච්. සුසිල් ප්‍රේමරත්න මයා, නො. 121 D, බුළුගහගොඩ, ගනේමුල්ල.
4. එච්. එම්. ජේ. බණ්ඩාර මයා, නො. 426/19, රජවත්ත පාර, කපුගොල්ල, උඩුගම්පොල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

2008.08.10 දින වෘත්තීය ක්‍රියාමාර්ගයකට සහභාගී වීම මත. එදින වැටුප් රහිත නිවාඩු බවට ප්‍රකාශයට පත් කිරීම තුළ ආර්. එම්. ජී. රාමනායක මහතා ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සිව් දෙනෙකු හට අසාධාරණයක් සිදුව ඇතැයි සඳහන් වීම හරහා ඔවුනට කවර සහන සැලසිය හැකිද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 ජූලි මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 727

මගේ යොමු අංකය: IR/15/07/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

අයි. එම්. පී. ඉලංගසිංහ මයා, නො. 45 B, වාරිමාර්ග නිවාස, කඳවල පාර, රත්මලාන.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කොළඹ 05, අමරසේකර මාවත, නො. 34හි, එම්. ඩී. කේ. කුලතුංග මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/15/07/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

අයි. එම්. පී. ඉලංගසිංහ මයා, නො. 45 B, වාරිමාර්ග නිවාස, කඳවල පාර, රත්මලාන.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කරන අයි. එම්. පී. ඉලංගසිංහ මහතාට 2005.01.01 දින සිට ජ්‍යෙෂ්ඨත්වයට අනුව තනතුර නොලැබී යාමෙන්, යම් අගතියක් සිදුවූයේද? එසේ වූයේ නම් කුමන සහනයක් හිමිවිය යුතුද යන්නත් වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 - 728

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.